(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 3(9).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 ඔක්තෝබර් 23 වැනි බදාදා**

---

## 2019 නොවැම්බර් 07 වැනි බ්‍රහස්පතින්දා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

උකස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය (අංක 1),— (469 අධිකාරය) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කොටුඅත්තාවල අභයභූමිය සම්බන්ධයෙන් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 23 දිනැති අංක 2007/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය (අංක 2),— (469 අධිකාරය) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කොඩිගහකන්ද අභයභූමිය සම්බන්ධයෙන් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 03 දිනැති අංක 2039/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය (අංක 3),— (469 අධිකාරය) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කායන්කර්ණි සමුද්‍රීය අභයභූමිය සම්බන්ධයෙන් සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අප්‍රේල් 11 දිනැති අංක 2118/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඍඇ) සහ 61(1)(ඍඇ) වගන්ති යටතේ ශ්‍රී ලංකා ජලජ තීරය තුළ මසුන් සහ ජලජ සම්පත් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 03 දිනැති අංක 2008/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ ධීවර මෙහෙයුම්වල දී උල් කරන ලද කූරු භාවිතා කිරීම තහනම් කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 03 දිනැති අංක 2008/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 සහ 61(1)(ද) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ තඹුවා මත්ස්‍ය විශේෂය ඇල්ලීම තහනම් කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අප්‍රේල් 11 දිනැති අංක 2014/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජුනි 15 දිනැති අංක 2023/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඕ) සහ 61(1)(ත) වගන්ති යටතේ නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවරයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 13 දිනැති අංක 2027/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 6),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වගන්තිය යටතේ මසුන් ගොඩබෑම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 13 දිනැති අංක 2027/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 7),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 64(අ) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61(1)(ආ) වගන්තිය යටතේ මාදැල් මඟින් මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 05 දිනැති අංක 2065/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 8),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවල ධීවර කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වන අවම ප්‍රමිති සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 25 දිනැති අංක 2107/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 9),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 6, 7, 8, 9 සහ 10 වගන්ති සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර මෙහෙයුම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 18 දිනැති අංක 2115/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 1),— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 23 දිනැති අංක 2137/85 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 2),— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 23 දිනැති අංක 2137/86 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 26 දිනැති අංක 2142/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2019 නොවැම්බර් 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

34/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින රැකියා වියුක්ති අනුපාතය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්ති ගැටලුව සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්කයන් සපුරා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

110/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා නීති විරෝධී මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා රජය වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම මුදල් වැය කළ ආකාරය කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා නීති විරෝධී මත්ද්‍රව්‍ය මඟින් රජය ලද වාර්ෂික දඩ මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) වැඩිම දඩ මුදල් ප්‍රමාණයක් අය කර ගන්නා ලද මත්ද්‍රව්‍ය වර්ගය කවරේද;

(v) මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

164/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ ඌව පළාතෙන් උසස් පෙළ විභාගය උසස් ලෙස සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍යයන්ගේ නම් කවරේද;

(iii) එම ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ඌව පළාත් සභාව ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ශිෂ්‍යත්ව ලබාදුන් ශිෂ්‍යයන්ගේ නම් හා එම ශිෂ්‍යත්වවල මූල්‍යමය වටිනාකම ආදි විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

545/'19

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට ගෙවනු ලබන වැඩිහිටි දීමනාව අයදුම් කළ විශාල පිරිසකට මේ වනතෙක් එම දීමනා ලැබී නොමැති බවත්;

(ii) මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විමසන විට දැනට දීමනාව ලබන පුද්ගලයන්ගෙන් ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉතිරි අයට ගෙවීම් කිරීමට කටයුතු කරන බව පවසන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්තමාන විෂය භාර අමාත්‍යවරයා අමාත්‍ය ධූරයට පත්වීමෙන් පසු වැඩිහිටි දීමනාව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට අයදුම්කර ඇති එහෙත්, මෙතෙක් එම දීමනාව ලැබී නොමැති වැඩිහිටියන්ට එම දීමනාව ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

556/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල ශ්‍රේණි අනුව ක්‍රියාත්මක වන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ඉඩම් හා ගොඩනැගිලි සහිත තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පාරතිපුරම්, පූන්නෙනීරාව්, පල්ලිකුඩා යන ප්‍රදේශවල උප තැපැල් කාර්යාල පිහිටුවීමේ අවශ්‍යතාවය පිළිබඳ දන්නේද;

(ii) එසේ නම්, 2016.09.05 දිනැති මාගේ ලිපිය සහ මටද පිටපතක් සහිතව තැපැල්පති වෙත යොමු කරන ලද අංක PPS & MR / HR / 09 - 182 දරන 2016.09.09 දිනැති ලිපිවලට පියවරක් නොගත්තේ මන්ද;

(iii) කල්මඩුනගර්, තිරුනගර්, කෝණාවිල්, කරඩිපෝක්කු, තිරුවෛයාරු, අම්බාල්කුලම්, මුරසුමෝට්ටෛ, දර්මපුරම්, කණ්ඩාවලෛ, පුලියම්පොක්කනෛ, කුංජුපරන්තන්, සිවනගර්, මුහමාලෛ, ඉයක්කච්චි, කිළාලි, එළුදුමට්ටුවාල්, සෝරන්පට්ටු, තට්ටුවන්කොට්ටි, සුණ්ඩික්කුලම්, සෙට්ටියක්කුරුච්චි, ඉරණෛතීවු, ගෞදාරිමුනෛ, පල්ලවරායන්කට්ටු, නල්ලූර්, කිරාංජි සහ වේරවිල් යන උප තැපැල් කාර්යාලවලට ස්ථිර ගොඩනැගිලි ලබා දෙන දිනය කවරේද;

(iv) කිළිනොච්චි, පරන්තන්, පච්චිලෛපල්ලි සහ පූනකරි යන ප්‍රධාන තැපැල් කාර්යාල නවීන/පරිගණක පහසුකම් සහිතව ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

784/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් අතර තේ ප්‍රචලිත කිරීමේ අරමුණෙන් කොළඹ තුරඟ තරඟ පිටියේ ස්ථාපිත කළ අලෙවි මධ්‍යස්ථානය විවෘත කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) වර්ෂ 2014 සිට 2017 දක්වා එම ආයතනය ලැබූ සමුච්චිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) 2017 වර්ෂයේදී මෙම අලෙවි මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඇති බව දන්නේද;

(iv) එම තීරණය ගනු ලැබුවේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම අලෙවි මධ්‍යස්ථානය වසා දැමීම හේතුවෙන් තේ මණ්ඩලයට අහිමි වූ මුළු මුදල කොපමණද;

(ii) මණ්ඩලයට අහිමි වූ උපකරණ, ලී බඩු සහ ගොඩනැගිලි කුලී ආදී වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කරන්නේද;

(iii) එම මධ්‍යස්ථානයේ සම්පත් ඵලදායී අයුරින් භාවිතා නොකළ නිලධාරීන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරයා ලබාදුන් උපදෙස් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

812/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුල්ලේරියාව, කොටිකාවත්ත, අංක 389/3F/2A දරන ලිපිනයේ වසර 12ක් පමණ පදිංචිව සිටින කේ. එම්. එම්. මර්සුක් මහතා විදේශගත වී සිටියදී ඔහුගේ නිවසට යාබදව පිහිටා තිබූ කාණු පද්ධතිය අවහිර කරමින් අනවසර තාප්පයක් ඉදිකර ගලියද සම්පූර්ණයෙන් වසා දමා ඇති බවත්;

(ii) මෙම අනවසර ඉදිකිරීම සිදු කර ඇත්තේ අංක 240/20B ස්ථානයේ පදිංචි මොහොමඩ් යූසුප් යන අය විසින් බවත්;

(iii) කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක KMPS/04/1/CL/59/2017 දරන 2018.05.30 දිනැති ලිපියෙන් දෙපාර්ශ්වය කැඳවා මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීමට කටයුතු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කැඳවීමෙන් අනතුරුවද, කාණු පද්ධතියේ අවහිරතාවය එලෙසම පවතින බවත්;

(ii) මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට කිසිදු ආයතනයකින් හෝ බලධාරීන්ගෙන් විසඳුමක් නොලැබීම හේතුවෙන් අවසානයේ ජනාධිපතිවරයාට, අග්‍රාමාත්‍යවරයා සහ අදාළ අමාත්‍යවරයාට ලිඛිතව කරුණු ඉදිරිපත් කළද, මේ වනතෙක් විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එබැවින්, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව හරහා මෙයට විසඳුමක් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

821/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෝමරන්කඩවල මහා විද්‍යාල භූමියේ ඉදිකරන ලද ත්‍රිකුණාමලය උතුරු කලාපයේ ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවසන්ව ඇතත්, නලජල පහසුකම් ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් එය තවමත් වසා දමා ඇති බව දන්නේද;

(ii) ගුරු පුහුණු මධ්‍යස්ථාන සඳහා සැලසුම් සකස් කරන විට පානීය හා අනෙකුත් ජල පහසුකම් සපුරා ගැනීමට අපේක්ෂා කර තිබූ ආකාරය කවරේද;

(iii) ගෝමරන්කඩවල මහා විද්‍යාල භූමියේ සහ ප්‍රාථමික විද්‍යාල භූමියේ පිහිටි ළිංවල ගැඹුර වැඩි කර එම ජලය RO ජල පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් මඟින් පිරිසිදු කිරීමෙන් ජල අවශ්‍යතාවය සපුරාලීමට පියවර ගත නොහැකිද;

(iv) මෙම ගුරු පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

835/'19

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය සභාවට අයත් වේප්පම්කුලම් සිට සිලාවතුර දක්වා වූ අභ්‍යන්තර මාර්ගය 2010 වර්ෂයේදී නැවත පදිංචිකිරීම් හා ආපදා සහන අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ සහ අවසන් කළ දිනය කවරේද;

(ii) එහි දුර ප්‍රමාණය කොපමණද;

(iii) මෙම මාර්ගය හරහා වැටී ඇති ගම්මාන කවරේද;

(iv) මෙහි කොන්ත්‍රාත් කටයුතු භාරදෙන ලද ආයතනය කවරේද;

(v) එවකට එම ආයතනයේ අයිතිකරුවන් (කොටස්කරුවන්) කවුරුන්ද;

(vi) ඒ සඳහා වෙන්කරන ලද මුදල කොපමණද;

(vii) මේ වනවිට එම මාර්ගය භාවිතා කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

931/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ (වක්ෆ් අංශයේ) අංක R/0552/ g/18 යටතේ ලියාපදිංචි කන්දෙවත්ත කාදීර් ජුම්මා පල්ලිය සහ ඔසනගොඩ පල්ලිය යන දේවස්ථානවලට අයත් වක්ෆ් මණ්ඩලය විසින් නිශ්චය කර ඇති නිශ්චල දේපළ (ඉඩම්,කඩකාමර,නිවාස) පිහිටා ඇති ස්ථානය අනුව, වාණිජ වටිනාකම සහ ගෘහස්ථ තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වක්ෆ් දේපළ නීත්‍යානුකූල ලෙස බදු ගිවිසුමක් යටතේ බදුකරුවන්ට නිකුත් කිරීමේදී වාණිජ හෝ ගෘහස්ථ වටිනාකම අනුව බදු කුලිය අය කිරීම සඳහා වක්ෆ් මණ්ඩලය පියවර ගන්නේද;

(iii) එකී වක්ෆ් දේපළ පරිහරණයේදී නීත්‍යානුකූල බදු ගිවිසුම්වලට එළඹී නොමැති සහ අනවසර හා නීති විරෝධී පදිංචිකරුවන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට වක්ෆ් මණ්ඩලය ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

941/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 ඔක්තෝබර් මාසයේදී ලෙලි කපු මෙට්‍රික් ටොන් 6000ක් ආනයනය කිරීමට තීරණය කර ඒ සඳහා බලපත්‍ර නිකුත් කළ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එකී බලපත්‍රලාභින්ගේ නම් හා ලිපිනයන් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 2000 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ලෙලි කපු නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2000 සිට මේ දක්වා මෙරටට ආනයනය කරන ලද ලෙලි කපු ප්‍රමාණයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒවා ආනයනය කරන ලද රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

979/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව නගරයේ සිට මරදන්කඩවල පාර ඔස්සේ කිලෝමීටර් එකහමාරක පමණ දුරින් පිහිටි ඔලුකරදගම හරහා අනුරාධපුර තලාව ප්‍රධාන මාර්ගයට සම්බන්ධවන කැකිරාව බස් ඩිපෝව සහ ජාත්‍යන්තර පාසල් පිහිටා ඇති කිලෝමීටර් 01 මීටර් 300 ක් පමණ වූ මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයට පත්වීමෙන් එම මාර්ගය ප්‍රයෝජනයට ගන්නා ජනතාව දැඩි අපහසුතාවට පත්වී ඇති බවත්;

(ii) බලයේ සිටි දේශපාලනඥයන් වැඩි දෙනෙක් තම විරුද්ධවාදීන් වැඩි පිරිසක් මෙම මාර්ගය දෙපස පදිංචි වී සිටීම හේතුවෙන් මෙම මාර්ගය සංවර්ධනය නොකළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දේශපාලන හේතු මත මෙතෙක් සංවර්ධනය නොකළ මෙම මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1014/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් 2014 වර්ෂයේ සැලසුම් සකස් කරනු ලැබූ, දිවුලපිටිය පානීය ජල යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් මේ වනතෙක් ආරම්භ කර නොමැති බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආයෝජනය කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් සපයන දේශීය හා විදේශීය මූලාශ්‍ර පිළිවෙළින් කවරේද;

(iv) මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වූ ඉදිකිරීම් සමාගමේ නම හා ලිපිනය කවරේද;

(v) මේ දක්වා මෙම ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් ආරම්භ නොකිරීමට බලපෑ හේතු සාධක කවරේද;

(vi) එම ගැටලු විසඳා ව්‍යාපෘතිය ඉදිරියට සිදු කරගෙන යාම සඳහා ගත් පියවර පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(vii) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කරන සහ අවසන් කරන දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1033/'19

ගරු ගාමිණී ලොකුගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිළියන්දල, මාකන්දන, කැකුලාවිට, අංක 191/සී යන ස්ථානයේ පදිංචි එල්. පී. කොඩිතුවක්කු මහත්මියගේ පුත් විදුර විදත් අමරතුංග 2009 වර්ෂයේදී කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ ජාතික පාසල් අධ්‍යක්ෂවරයා වෙත පැමිණිලි කළ බවත්;

(ii) එහිදී ලැබුණු උපදෙස් මත කොඩිතුවක්කු මහත්මිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කළ අතර, මෙම දරුවා රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීමට එම කොමිසම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශයක් ලබාදුන් බවත්;

(iii) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරි කටයුතු සිදු නොකළ බැවින්, කොඩිතුවක්කු මහත්මිය පාර්ලිමේන්තුවේ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත පෙත්සමක් ඉදිරිපත් කළ බවත්;

(iv) 2009 වර්ෂයේ සිට මේ දක්වා දරුවා මෙම පාසලට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අසමත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විදුර විදත් අමරතුංග දරුවා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1035/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.09.01 දිනෙන් පසුව ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් අතරින් 2019.05.01 දින දක්වා රටින් බැහැර නොවූ විදේශිකයන් සිටින්නේද;

(ii) එසේ නම්, ඔවුන් පැමිණි රට සහ වීසා බලපත්‍ර ලබා ගෙන ඇති කාලය කවරේද;

(iii) මෙලෙස නීත්‍යානුකූල නොවන අයුරින් රට තුළ රැඳී සිටින විදේශිකයන් කවුරුන්ද;

(iv) ඔවුන්ගේ විදෙස් ගමන් බලපත්‍ර අංක කවරේද;

(v) ඔවුන්ගේ ශ්‍රී ලාංකික ලිපිනයන් ලෙස දක්වා ඇති ලිපින ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 නොවැම්බර් 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

24/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිතාවන දුරකථන ජාලයන් හරහා සිදුවන දෙබස්වලට සවන්දීම හෝ පටිගත කිරීම සඳහා උපකරණ පද්ධතියක් රජය හෝ යම් ආයතනයක් විසින් මෙරටට ගෙන්වා හෝ ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එම පද්ධතියේ වටිනාකම කොපමණද;

(iii) එම පද්ධතිය මඟින් ආවරණය වන දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි පද්ධතියක් ගෙන්වීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

138/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, වැවිලි සමාගම් ආශ්‍රිතව සේවය කරන සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල මන්ද පෝෂණය ඉහළ මට්ටමක පවතින බව දන්නේද;

(ii) යහපාලන රජය විසින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා ලබාදෙන "පෝෂණ මල්ල" වැඩසටහනට සමගාමීව, වතු වැවිලි සමාගම් හරහා ද එම ජනතාවට පෝෂණ මල්ලක් ලබාදීම සුදුසු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, වතු වැවිලි සමාගම් හරහා එවැනි වැඩසටහනක් දියත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

220/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ඇස්බැස්ටෝස් භාවිතය තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා රජය විසින් පදනම් කරගත් විද්වත් කමිටු හෝ විශේෂඥ වාර්තා කවරේද;

(iv) එම තහනම ඉවත් කිරීම සඳහා රජය තීන්දු කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) යළිත් ඇස්බැස්ටෝස් භාවිතය සුදුසු බව නිර්දේශ කළ විද්වතුන් හෝ විශේෂඥයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

372/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු නාගස්තැන්න වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

437/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2018.06.30 දිනට බදු පදනම මත පිටස්තර පුද්ගලයන්ට ලබා දී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ලබා දී ඇති පුද්ගලයන්ගේ හා ආයතනවල නම, ලිපිනය, බදු දී ඇති කාලය, බදු දී ඇති ඉඩමේ ප්‍රමාණය හා බදු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ඉඩම් බදු දීමේදී විවෘත වෙළෙඳපොළ මිල ගණන් අනුව දේපළ තක්සේරු කර ඒ අනුව බදු මුදල් අය කිරීම සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉඩම් බද්දට ලබා ගත් පුද්ගලයන් ඒවා අතුරු බදු දී ඇත්නම්, එම ඉඩම් කවරේද;

(ii) එසේ අතුරු බදු ලබා දුන් අයගේ නම, ලිපිනය, බදු දී ඇති කාලය, ඉඩමේ ප්‍රමාණය හා බදු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බදු අය කිරීම යාවත්කාලීන නොකිරීම හේතුවෙන් හා නීතිවිරෝධී අතුරු බදු දීම හේතුවෙන් පසුගිය වර්ෂ තුනේදී මණ්ඩලයට කොපමණ මුදලක් අහිමි වී තිබේද;

(iv) බදු ගිවිසුම ප්‍රකාරව අතුරු බදු දීමට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

446/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ, හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහි කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා LTTE සාමාජිකයෙකු, දෙමළ ඩයස්පෝරාව සහ නම් දරා සිටින පාතාල සාමාජිකයෙකු සමඟ සම්බන්ධතා පවත්වා ඇති අයෙකු වන බැවින්, ජනාධිපතිවරයාට සහ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයාට දැනට ලබාදී ඇති ආරක්ෂාව වැඩි නොකරන්නේ මන්ද;

(ii) ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා දිවයින පුරා මහජන හමුවීම් ඇතුළු විවිධ කටයුතුවල නිරත වන බැවින්, ඔවුන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා වෙඩි නොවදින රථ හෝ එවැනි පහසුකම් ලබා නොදෙන්නේ මන්ද;

(iii) මේ සම්බන්ධයෙන් කරුණු අනාවරණය කළ නාමල් කුමාර නමැත්තා ප්‍රකාශ කරන පරිදි සිද්ධියට අදාළ තාක්ෂණික සාක්ෂි විනාඩි 05ක් වැනි කෙටි කාලයකින් විනාශ කළ හැකි බැවින්, පරීක්ෂණ සිදුවන විටත් එකී නියෝජ්‍ය පොලිස්පතිවරයා සේවයේ තබා ගැනීමට පොලිස්පතිවරයාට ඇති අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

540/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එයාර් වයිස් මාර්ෂල් කේ.ටී.බී.පී. ජයම්පති මහතා 2008.01.08 දාතමින් සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ආනයනය කිරීමට බලපත්‍රයක් ලබාගෙන තම වාහනය රේගුවෙන් නිදහස් කරගෙන ඇති බවත්;

(ii) එම නිලධාරියාට යළිත් සහනදායී පදනම මත මෝටර් රථයක් ලබාගත හැක්කේ වසර 5කට පසුව වුවද, ඉහත කී බලපත්‍රය පිළිබඳ තොරතුරු සාවද්‍ය ලෙස සඳහන් කරමින් 2011.01.14 දින එවකට සිටි ගුවන් හමුදාපතිවරයාගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව යළිත් සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ආනයනය කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කර, 2011.06.07 දින අදාළ බලපත්‍රය ලබාගෙන මෝටර් රථයක් ආනයනය කර ඇති බවත්;

(iii) ඒ අනුව ඔහු චක්‍රලේඛ නියමයන් උල්ලංඝනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, මෙම නිලධාරියාට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

(ii) චක්‍රලේඛ නියමයන්ට එරෙහිව සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ගෙන්වීමට මෙම නිලධාරියාට නිර්දේශ නිකුත් කිරීම පිළිබඳව එවකට සිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා ගුවන් හමුදාපතිවරයාට එරෙහිව ගනු ලැබූ නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

601/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අංක 01 ට ශ්‍රේණිගතව තිබූ ස්වාධීන රූපවාහිනි සේවය මේ වනවිට 06 වන ස්ථානයට පත් වී තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2014 සහ 2017 දී ස්වාධීන රූපවාහිනී ආයතනයේ වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්වාධීන රූපවාහිනී සේවය විකිණීමේ ක්‍රියාදාමයක් සැකසෙමින් පවතින්නේද;

(iii) මෙම ආයතනයේ සේවක වැටුප් ගෙවනු ලබන්නේ ස්ථාවර තැන්පතුවලින්ද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

879/'19

ගරු විමලවීර දිසානායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

(ii) අලුතින් ප්‍රතිලාභී පවුල් තෝරා ගැනීමක් සිදු කරනු ලබන්නේද;

(iii) එසේ නම්, එම තෝරාගැනීම් සිදු කරනු ලබන පදනම කවරේද;

(iv) එම නිර්ණායකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

885/'19

ගරු එස්.සී. මුතුකුමාරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුදල් අමාත්‍යාංශය යටතේ "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි මූලික අරමුණ කවරේද;

(iii) මේ වනවිට එම අරමුණ කොපමණ දුරට ඉටුවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2019.03.08 දින වනවිට කළුතර දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් වැඩපිළිවෙළ යටතේ ණය පහසුකම් ලබාදී ඇති නව ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(ii) ලබා දී ඇති එම ණය, එක් එක් ව්‍යාපාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) 2019.03.08 දින වනවිට අනුරාධපුර දිස්ත්‍රික්කය යටතේ ණය පහසුකම් ලබාදී ඇති නව ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(ii) ලබා දී ඇති එම ණය මුදල් එක් එක් ව්‍යාපාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ණය යෝජනා ක්‍රමයේ පරමාර්ථය කොපමණ දුරට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉටු වී තිබේද;

(iv) මෙම දිස්ත්‍රික්ක දෙක අතර මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මකවීමේ පරතරයක් තිබේද;

(v) එය වෙනස් කිරීමට උත්සාහ ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1197/'19

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආනමඩුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වපසරිය වර්ග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වෙසෙන ජනගහනය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙවැනි විශාල පළාත් පාලන ආයතනයකට ලැබෙන ප්‍රධාන ආදායම වන්නේ සතිපොළ බදු දීමෙන් ලැබෙන ආදායම බවත්;

(ii) ආනමඩුව ප්‍රාදේශීය සභාව සතු ආනමඩුව සති පොළ සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිල වශයෙන් භාරගත් බවත්;

(iii) එහි සංවර්ධන කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිම කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ සංවර්ධනය කළ ආනමඩුව සති පොළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආනමඩුව ප්‍රාදේශීය සභාවට මේ දක්වා ආපසු භාර දී නොමැති බවත්;

(ii) පළාත් පාලන පනත යටතේ සති පොළ ආදායම් එකතු කිරීම ප්‍රාදේශීය සභාව සතු වගකීමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) දැනට ඉදිකිරීම් කටයුතු නිම කර ඇති ආනමඩුව සති පොළ නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ආනමඩුව ප්‍රාදේශීය සභාව වෙත නැවත පවරා දීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 60/ඒ බෝලගල ග්‍රාම නිලධාරී වසමේ, හල්පේ විලවත්ත නමැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමේ පාවෙන හෝටල් ව්‍යාපෘතියක් සඳහා අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, අවසර ලබා දීමේදී සැලකිල්ලට ගත් නිර්ණායක කවරේද;

(iii) එම ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම් පිළිබඳ වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iv) හෝටල් ව්‍යාපෘතිය ආරම්භ කරන හා අවසන් කරන දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මැටි කැපීම සඳහාද අවසර ලබා දී ඇති ඉහත අ (i) හි සඳහන් ඉඩමේ අවසර ලබා දී ඇති සීමාව ඉක්මවා මැටි කැපීම සිදු කරන බවත්;

(ii) ඒ හේතුවෙන් ප්‍රාදේශීය සභා අරමුදල් හා මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් සංවර්ධනය කරන ලද ප්‍රදේශයේ ක්‍රීඩාපිටියද ප්‍රදේශවාසීන්ට අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1251/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකර ප්‍රදේශවල ගුරු සහායකයන් 3000කට පමණ මධ්‍යම රජය විසින් පත්වීම් ලබා දී මේ වනවිට ඔවුන්ගෙන් පිරිසක් ගුරු පුහුණුව අවසන් කර ඇති බවත්;

(ii) පළාත් අධ්‍යාපන සේවය ඔවුන් විධිමත් ආකාරයට ගුරු සේවය සඳහා අන්තර්ග්‍රහණය කිරීම හෝ ඔවුන් වෙනුවෙන් සුදුසු වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සිදු කර නොමැති බවත්;

(iii) මේ වනවිට එක් එක් පළාත් සභා වෙනස් තීරණ පදනම් කර ගනිමින් ගුරු සහායකයන් වෙනස් වැටුප් පරිමාණයන්ට අන්තර්ග්‍රහණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත පත්වීම් ලබාදුන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව ඔවුන්ට හිමි වැටුප් පරිමාණය කවරේද;

(ii) පුහුණුවෙන් පසු ඔවුන්ට ලබාදිය යුතු වැටුප් පරිමාණය සහ ගුරු ශ්‍රේණිය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර තිබේද;

(iii) රජය විසින් එකම අවස්ථාවකදී ලබාදුන් පත්වීම් සඳහා එක් එක් පළාත් සභා විසින් වෙනස් වූ තීරණ ගැනීම වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1274/'19

ගරු ටී. බී. ඒකනායක මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.06.30 දිනට විදේශ රටවල සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව, ඔවුන් සේවයේ යෙදී සිටින රට සහ පුහුණු හා නුපුහුණු භාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුහුණු/නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශයන්හි සේවය සඳහා පුහුණු ශ්‍රමිකයන් යැවීමට රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1287/'19

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටින වැඩිහිටි ජනගහනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වැඩිහිටි දීමනාව ලබා ගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ සිටින මාතලේ දිස්ත්‍රික්කයේ සියලු දෙනාට කඩිනමින් එම දීමනාව ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 නොවැම්බර් 21 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

163/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති පිරිවෙන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිවෙන්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පිරිවෙනෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කරන සේවකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පිරිවෙන් අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

438/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් ගෙවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ඇතුළු ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධ විස්තර වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(ii) මෙතෙක් ගෙවා නොමැති දීමනාවල එකතුව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත කී අරමුදල් සඳහා මුදල් නොගෙවීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් කාර්යාලය මගින් පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

541/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) දැනට වසර කිහිපයකට පෙර පොලිස් නිලධාරින්ට රු.150,000/-ක සහන මිලකට යතුරුපැදි ලබා දුන් බවත්;

(ii) එම යතුරුපැදි ලබා දීමේදී කිසිදු කොන්දේසියකට යටත් නොකළ බවත්;

(iii) එසේ වුවද, යතුරුපැදි ලබා ගත් විශ්‍රාමික පොලිස් නිලධාරීන් සියලු දෙනාටම පාහේ රු.150,000 - 200,000 අතර මුදලක් ගෙවන ලෙස බල කර ඇති බවත්;

(iv) එම මුදල ගෙවන තෙක් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකරන බව ඔවුන්ගේ සේවා ස්ථානවලින් දන්වා ඇති බවත්;

(v) මේ අනුව විශ්‍රාමික පොලිස් නිලධාරීන් විශාල පිරිසක් දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් නොලැබීම හේතුවෙන් අසරණවී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස නොපමාව සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

638/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය භාර හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ජනාධිපතිවරයාට හා ආරක්ෂක අමාත්‍යාංශයේ, හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව සිදු කළේ යැයි කියන කුමන්ත්‍රණය සම්බන්ධයෙන්,

(i) එම නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් ප්‍රකාශයක් ලබාගෙන තිබේද;

(ii) ඔහුගේ කාර්යාල, නිවාස හා ජංගම දුරකථන ඇමතුම් පිළිබඳ විමර්ශනයක් කර තිබේද;

(iii) දූෂණ විරෝධී බලකායේ මෙහෙයුම් අධ්‍යක්ෂක බව කියන නාමල් කුමාර මහතාට ජීවිත තර්ජන එල්ල වී ඇති බව කියන හෙයින්, ඒ සම්බන්ධ සත්‍ය අසත්‍යතාවය හෙළිකර ගන්නා තෙක්, ඔහුගේ ආරක්ෂාව තහවුරු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉදිරි නීතිමය කටයුතුවලට බාධාවක් නොවන පරිදි මෙම සිද්ධියේ වත්මන් තත්ත්වය කෙසේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ජනාධිපතිවරයාගේ ආරක්ෂාව ඔහුගේ අභිමතය පරිදි තීරණය කළ හැකි වුවත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට හා ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට ආරක්ෂාව වැඩි කිරීමට පියවර ගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

751/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018.07.01 සිට 2018.12.31 දක්වා අග්‍රාමාත්‍යවරයා සහභාගි වූ විදේශ සංචාර කවරේද;

(ii) එම එක් එක් සංචාරයට සහභාගි වූ පුද්ගලයන්ගේ නම්, ඔවුන් රජයේ තනතුරක් දරන්නේ නම්, එම තනතුරු සහ සංචාරයට සහභාගි වීමට හේතු කවරේද;

(iii) 2016.01.01 සිට 2018.12.31 දින දක්වා අග්‍රාමාත්‍යවරයා සහභාගි වූ විදේශ සංචාර සඳහා රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම් ද ඇතුළුව එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

916/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) ඒ සඳහා මුදල් ලබාගත් මූලාශ්‍ර කවරේද;

(iii) මේ දක්වා එහි පැවති ක්‍රිකට් තරඟ සංඛ්‍යාව හා පැවති තරඟ වර්ග කවරේද;

(iv) මේ දක්වා එම ක්‍රීඩාංගණය තුළින් ඉපයූ ආදායම හා නඩත්තු වියදම් කවරේද;

(v) මෙම ක්‍රීඩාංගණය දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1029/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 240 මඟින් ගොඩනැගිලි හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා වෙන්කළ රුපියල් මිලියන 500 උපයෝජනය කළ ආකාරය කවරේද;

(ii) උක්ත අයවැය යෝජනාව අනුව මාස තුනකට තරුණයන් 7500 බැගින්, වර්ෂය තුළදී තරුණයන් 30,000කට පුහුණුව ලබාදීමේ ඉලක්කය සපුරා ගනු ලැබුවේද;

(iii) තිස් දහසක් වැනි විශාල තරුණ පිරිසකට පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහනට උරදුන් ආයතන හා සංවිධාන කවරේද යන්නත්, එම එක් එක් ආයතනයකට ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1052/’19

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, සේවයේ නියුතු ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) දෙපාර්තමේන්තුවේ තනතුරුවල දැනට පුරප්පාඩු පවතින්නේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ආගමන විගමන පාලක ජෙනරාල් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කුමන ශ්‍රේණියකට අයත් තනතුරක්ද;

(iv) එම තනතුර මේ වනවිට පුරප්පාඩු වී පවතින්නේ නම්, පුරප්පාඩු වූ දිනය කවරේද;

(v) රටේ පවතින වර්තමාන ආරක්ෂක තත්ත්වය අනුව, මෙම තනතුර පිරවීමට පියවර නොගැනීම තුළ රටේ ආරක්ෂක තත්ත්වයට එය සෘජුවම බලපාන බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම පුරප්පාඩුව පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1114/’19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අට පිරිකරවල ඇතුළත් විය යුතු ද්‍රව්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) අද වනවිට වයඹ පළාත තුළ අලෙවි කරනු ලබන අට පිරිකරවල එම ද්‍රව්‍ය අඩංගු නොවන අවස්ථා ඇති බව දන්නේද;

(iv) එසේ නම්, අට පිරිකරවල නියමිත ප්‍රමිතිය ආරක්ෂා කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1176/’19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ දැනට විනිශ්චයට ලක් වෙමින් පවතින දික්කසාද නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම දික්කසාද නඩු එක් එක් දිස්ත්‍රික්කය සහ එක් එක් ජාතිකත්වය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2008 සිට 2019 දක්වා කාලය තුළ දික්කසාද වීමට අවසර ලැබී ඇති පවුල් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1178/'19

ගරු විදුර වික්‍රමනායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලීකරණය කිරීමේදී රැකියා අහිමිවූවන්ට අවුරුදු 05ක වැටුප් සහ සියලු දීමනාද ඇතුළත් වන්දියක් ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇති බවත්;

(ii) වන්දි ගෙවීමට නිර්දේශ වූ සංස්ථාවේ ලිපිකරුවන් 06 දෙනෙකු අතරින් දෙදෙනෙකුට අදාළ වන්දි මුදලට දීමනා ඇතුළත් නොකර වැටුප් පමණක් සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් වන්දි මුදල භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රැකියා අහිමිවූවන්ගෙන් කොටසකට නැවත රැකියා ලබා දී ඇති බවත්;

(ii) පුද්ගලීකරණය කරන අවස්ථාවේ වන්දි මුදල් ලබා දීමේදී EPF සහ ETF ප්‍රතිලාභ ද ගෙවීමට හැකියාව තිබුණත්, එම මුදල් සේවය අහිමි වූ සේවකයන්ට ලබා දී නොමැති බවත්;

(iii) පුද්ගලීකරණය කිරීමෙන් පසු ඇතිකරගත් ගිවිසුමට අනුව කිසිදු සේවකයකුගේ රැකියා අහිමි නොකරන බවට පොරොන්දු වී ඇතත්, සේවය අහිමිවූ සේවකයන් 1500කට පමණ කිසිදු සහනයක් ලබාදී නොමැති අතර, එම කණ්ඩායමෙන් පුද්ගලයන් 200ක් පමණ ජීවිතක්ෂයට පත්වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) අමාත්‍ය මණ්ඩල අනුමතිය ප්‍රකාරව සේවය අහිමි වූ සේවකයන්ට සහන ලබාදීමට පියවර ගනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1237/'19

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නෝර්වේ රජයේ පරිත්‍යාගයක් වශයෙන් ලබා දුන් ගාල්ල අයිස් යන්ත්‍රාගාරය සුනාමි ව්‍යසනයෙන් පසු ජපන් රජයේ පරිත්‍යාගයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව ධීවර සංස්ථාවේ, ගාල්ල ධීවර වරාය විසින් ක්‍රියාත්මක කළ බවත්;

(ii) එම යන්ත්‍රාගාරයේ දිනකට අයිස් කැට 1024 ක් නිෂ්පාදනය කළ අතර කැටයක් රුපියල් 220/-ක පහසු මිලකට ධීවර ජනතාවට ලබා දුන් බවත්;

(iii) නිලධාරින්ගේ කළමනාකරණ දුර්වලතා හේතුවෙන් නිෂ්පාදනය දිනකට කැට 800 දක්වා අඩු වූ බවත්;

(iv) ධීවර ජනතාවගේ විරෝධතාවය නොසලකමින් යන්ත්‍රාගාරය පෞද්ගලික අංශයට පවරා ඇති බවත්;

(v) එමඟින් ගාල්ල වරාය ප්‍රයෝජනයට ගන්නා ධීවර ජනතාවට විශාල අසාධාරණයක් සිදු වී ඇති අතර සේවකයන් 72 දෙනෙකුගේ සේවය අස්ථාවර තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම යන්ත්‍රාගාරය පෞද්ගලික අංශයට පවරා තිබේ නම්, එමඟින් ජපන් ජනතාවගෙන් ලද පරිත්‍යාගයක් පෞද්ගලීකරණය කර ඇති බවත්;

(ii) එමඟින් ඉදිරි ජාත්‍යන්තර පරිත්‍යාග අධෛර්යමත් විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම තත්ත්වය වළක්වා නැවත පෙර තිබූ තත්ත්වයට එම ආයතනය පත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1247/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 60/ඒ බෝලගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හල්පේ විලවත්ත නමැති ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් බවත්;

(ii) එම ඉඩම පාවෙන හෝටල් ව්‍යාපෘතියක් සඳහා අනුමතිය ලබා දී ඇති බවත්;

(iii) එම ඉඩම කූට ලේඛන සකස් කර විකුණා ඇති බවත්;

(iv) පාවෙන හෝටල් ව්‍යාපෘතිය මුවාවෙන් මැටි කැපීමේ ව්‍යාපෘතිය කරගෙන යන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් පවරා ගන්නා ලද ඉඩම, කවර පදනමක් මත හෝ පවරා දී ඇත්නම්, එම පුද්ගලයාට තෙවන පාර්ශ්වයක් වෙත පැවරීම/ විකිණීම සිදු කළ හැකිද;

(ii) පරිසරය හා බැඳුණු යම් ව්‍යාපෘතියක් සඳහා අනුමතිය ලබා දී ඇත්නම්, ඒ පිළිබඳ පසු විපරමක් හා නියාමනයක් නොකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1275/'19

ගරු ටී. බී. ඒකනායක මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පළාත් පාලන ආයතන මඟින් කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන්නේද;

(ii) ඒ සඳහා අමාත්‍යාංශය යටතේ කිසියම් වැඩපිළිවෙළක් ආරම්භකර තිබේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ආයතන මට්ටමින් අබලි වීදුරු ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම ස්ථානයේ ලිපිනය කවරේද;

(v) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 නොවැම්බර් 22 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

169/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ වාරිමාර්ග උපදේශක වශයෙන් එස්. එච්. ආර්. බන්දුසේන මහතා පත්කර සිටි බව දන්නේද;

(ii) ඔහු එම තනතුරට පත්කළ දිනය හා ගෙවන ලද මාසික දීමනා කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) වාරිමාර්ග කටයුතු සම්බන්ධව උපදෙස් ලබාදීමට තරම් ඔහු සතු වූ විශේෂ සුදුසුකම් කවරේද;

(v) මෙම පත්කිරීම සම්බන්ධයෙන් විගණන විමසුමේ දැක්වෙන කරුණු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

277/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සහල් ආනයනයේදී සහල් කිලෝවක් සඳහා අයකරන ලද බදු මුදල කොපමණද;

(iii) ඒ අනුව, 2015, 2016 සහ 2017 වර්ෂවලදී සහල් ආනයනය සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iv) ඉහත වර්ෂවලදී සහල් ආනයනය සඳහා අය කරන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම වර්ෂවල සහල් මිලෙහි උච්චාවචනය පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

342/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිමාගම නමැති ගම හා කලාවැව සම්බන්ධ කිරීම සඳහා පාලමක් ඉදිකිරීමට සැලසුම් කර මුල් ගල පිහිටුවා වර්ෂ ගණනාවක් ගත වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම කාර්යය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

420/’19

ගරු හේෂා විතානගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගියදා නිමාවට පත් වූ දකුණු ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා නිලධාරින්ගේ සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

(ii) එම තරඟාවලියේදී ලංකාව ජයග්‍රහණය කළ පදක්කම් සංඛ්‍යාව හා එම පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නම් කවරේද;

(iii) එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මූල්‍යමය තිළිණයක් ලබාදීමට අමාත්‍යාංශය තීරණය කර තිබේද;

(iv) එසේ නම්, මෙතෙක් මූල්‍යමය තිළිණ ලබාදුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා පුහුණුකරුවන්ගේ නම් කවරේද;

(v) මෙතෙක් මූල්‍යමය තිළිණ ලබා නොදුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට එම තිළිණ කඩිනමින් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

427/’19

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කර ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා මෙරට ගම්මිරිස් ඵලදාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට 2018 දක්වා අපනයනය කරනු ලැබූ ගම්මිරිස් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙරට නිෂ්පාදිත ගම්මිරිස්වලට වඩා වැඩි ප්‍රමාණයක් මෙම වර්ෂ තුළදී අපනයනය කර තිබේද;

(v) එසේ නම්, ශ්‍රී ලංකාව ගම්මිරිස් ආනයනය කරනු ලබන්නේද;

(vi) ශ්‍රී ලංකාව ගම්මිරිස් ආනයනය කරනු ලබන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කිරීම මඟින් මෙරට ගම්මිරිස් වගාව විනාශ වී යන අතර අහිංසක ගම්මිරිස් ගොවීන්ට අසාධාරණයක් සිදු කරමින් ඉහළ මට්ටමේ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුට පමණක් ප්‍රතිලාභ අත් වන බව දන්නේද;

(ii) ගම්මිරිස් කර්මාන්තය නැවත නඟා සිටුවීමට යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) එසේ නම්, එය කවරක්ද;

(iv) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

506/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හිටපු මහබැංකු අධිපති, අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ නැගණිය වන ශිරෝමනී වික්‍රමසිංහ මහත්මිය, ලංකාපුත්‍ර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස කටයුතු කළ සමයේ දූෂණ හා වංචා සිදුවී තිබෙන බව ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් විගණන ආයතනය විසින් හෙළිදරව් කර ඇති බවත්;

(ii) වර්ෂ 2006 සිට 2014 දක්වා බැංකු පනත උල්ලංඝනය කරමින් දේශපාලන හිතවතුන්ට ණය ලබාදී ඇති බවත්;

(iii) නැවත ගෙවීමේ හැකියාව පිළිබඳ නොසලකා රජයේ ඉඩම්, පන්සල් සතු ඉඩම්, මුඩු ඉඩම් සහ මැණික් ලෙස හඟවා තිරුවානා ගල් යනාදිය ඇපයට තබා ණය ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ ආකාරයෙන් ණය ලබාගෙන ඇති පුද්ගලයන් සහ ආයතන කවරේද;

(ii) එම එක් එක් පුද්ගලයන් සහ ආයතන ලබාගත් ණය මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ණය මුදල්වලින් නැවත ගෙවා ඇති ප්‍රමාණය කොපමණද;

(iv) මෙලෙස ණය ලබා දීමට අනුමතිය ලබා දුන් එවකට ප්‍රධාන විධායක නිලධාරිනිය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එහි ප්‍රගතිය කවරේද;

(vi) නොඑසේ නම්, මේ සම්බන්ධව විධිමත් නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

674/'18

ගරු චන්දිම ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, අංක 635 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මහවැව පාලම අබලන් වී ඇති බවත්;

(ii) එම පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ඇස්තමේන්තුවක් ඔබ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්;

(iii) අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ සඳහා ප්‍රතිපාදන මේ දක්වා ලබා දී නොමැති බවත්;

(iv) ඉදිරි වර්ෂා කාලයේදී මහවැව පාලම විනාශ වුවහොත්, ගම්මාන 8 ක ජීවත් වන 7000ක් පමණ වූ ගොවි ජනතාව ප්‍රවාහන දුෂ්කරතාවයකට පත්වී අසරණ වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

766/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රට පුරා ක්‍රියාත්මකව පවතින රට බීම අලෙවි සැල් හෙවත් වයින් ස්ටෝර්ස් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන්, බලපත්‍ර අංක හා මුලින්ම බලපත්‍රය ලබාදී ඇති දිනය හෝ වර්ෂය සහ එකී ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සැර ප්‍රතිශතය අනුව සහ එක් එක් වෙළඳ නාමය අනුව 2000 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික රට බීම පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

782/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට රාජකාරි අවශ්‍යතා සඳහා ලබා දී ඇති වාහනයේ වර්ගය හා ලියාපදිංචි අංකය කවරේද;

(ii) එම වාහනය අධිකාරිය වෙත ලබා ගත් පදනම කවරේද; කල්බදු ක්‍රමය යටතේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iii) මෙම වාහන ලබාගැනීම ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ සිදුවී තිබේද;

(iv) මෙම ප්‍රසම්පාදන කමිටුවේ ප්‍රසම්පාදන කටයුතු භාර නිලධාරියා ලෙස හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කළ නිලධාරීන් කවුරුන්ද;

(v) ප්‍රසම්පාදන ක්‍රියාවලියට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැරදි සහගත ලෙස ප්‍රසම්පාදන කාර්යය සිදුකර ඇත්නම්, එකී වරද සිදු කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරනු ලබන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

847/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතු ගුවන් විදුලි සේවා සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට එම එක් එක් ගුවන් විදුලි සේවාව ඉපැයූ ආදායම හා නඩත්තු වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කාල සීමාව තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බඳවාගත් සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන් ජනතාව අතර ජනප්‍රිය කරවීමට මෙතෙක් ගෙන ඇති පියවර සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

866/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කරඳන, විහාරහේන ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ජල බෝතල් කිරීමේ ව්‍යාපාරය හේතුවෙන් ප්‍රදේශයේ පානීය ජල මට්ටම පහත වැටී ඇති බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපාරය මුලින් 2003.12.16 දින "රබර් ප්‍රඩක්ට්ස්" නමින් ආරම්භ කර පවත්වාගෙන ගිය අතර පසුව, 2017.06.30 දින "විහාරා නැචුරල් ප්‍රඩක්ට්ස්" නමින් නල ළිඳක් මඟින් ජලය බෝතල් කර අලෙවි කරන බව දන්නේද;

(iii) ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධය සැලකිල්ලට ගෙන මේ සම්බන්ධයෙන් මා විසින් ලිපි ගණනාවක් එවා ඇති නමුත්, මේ සඳහා නිසි විසඳුමක් ලබා නොදෙන්නේ මන්ද;

(iv) මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර අදාළ ප්‍රදේශයේ ජල මට්ටම පහළ වැටීම වැළැක්වීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

900/'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා ජාත්‍යන්තර වශයෙන් ආධාර ලබාගත් රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) ලබාගත් ආධාර අතරින් මූල්‍යාධාර, ද්‍රව්‍යාධාර සහ ව්‍යාපෘති ආධාර වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) ප්‍රදානය කළ රටවල් සහ එම රටවල්වල ආධාර ප්‍රදානය කරන ලද ආයතන කවරේද;

(iv) එම ආධාරවලින් මෙරට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(v) ආධාර ලබාගත් රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රධානීන්ගේ නම් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

933/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඒ. එච්. එම්. ෆයිරුක් මහතා, කොළඹ, දාරුස්සලාම් මහා විද්‍යාලයේ සේවයේ නියුතුව සිට අංක බප/කො/කලාප/ගුරුපා/7 හා 2006.06.30 දිනැති ලිපිය මඟින් 1989.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගැන්වූ උපගුරුවරයෙකු බව දන්නේද;

(ii) එකී දිනයේ සිට විශ්‍රාම ගැන්වූ ෆයිරුක් මහතාට 1997.01.15 දින සිට විශ්‍රාම වැටුප ගෙවීම අනුමත කළද මෙතෙක් විශ්‍රාම වැටුප් ලබාදීම ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iii) වසර 25ක කාලයක් ගුරු සේවයේ නියුතුව සිට දැනට වයෝවෘද්ධ තත්ත්වයේ පසුවන ෆයිරුක් මහතාට හිමි විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් අදාළ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමටත් සහ විශ්‍රාම වැටුප් නොපමාව ලබාදීමටත් පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

969/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොටගල, සිරිපැරකුම් විදුහල ආසන්නයේ පිහිටා තිබූ කුකුල් ගොවිපොළ, පාසල් සංවර්ධන සමිතියේ හා ගුරු මණ්ඩලයේ විරෝධය හේතුවෙන් 2015 වර්ෂයේදී ඉවත් කරනු ලැබූ බවත්;

(ii) එම කුකුල් ගොවිපළ වෙනුවට, මේ වනවිට විශාල ප්‍රමාණයේ ගවගාලක් විවෘත කිරීමට කටයුතු කරනගෙන යන බවත්;

(iii) ගවගාලක් ස්ථාපිත කිරීමෙන් ආසන්නයේ පිහිටි සිරිපැරකුම් විදුහලේ ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය තත්ත්වයට වන අහිතකර බලපෑම හේතුවෙන් පාසල් සංවර්ධන සමිතිය හා ගුරුමණ්ඩලය විරෝධය දක්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගවගාලක් ඉදිකිරීම හේතුවෙන් ශිෂ්‍යයන්ට විය හැකි හානිය සැලකිල්ලට ගෙන මෙම ගවගාල ඉදිකිරීම නැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1030/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 243ට අනුව, සංචාරක කර්මාන්තයට අදාළ පුහුණු පාඨමාලාවලට වෙන් කරන ලද රුපියල් මිලියන 100 උපයෝජනය කළ ආකාරය කවරේද;

(ii) උක්ත යෝජනාවේ සඳහන් පරිදි කාර්තුවකට තරුණයන් 3000 බැගින් වර්ෂය තුළදී තරුණයන් 12,000කට පුහුණුව ලබා දුන්නේද;

(iii) මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කළ ආයතන හෝ සංවිධාන කවරේද; එම ආයතන හෝ සංවිධානවලට වර්ෂය තුළදී කරනු ලැබූ මුළු ගෙවීම් ප්‍රමාණය සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 දෙසැම්බර් 06 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 11 /'18

ගරු වමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන ශ්‍රී ලාංකික බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මඟින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය භූගෝලීය වශයෙන් සලකා බලන කල මුහුදු සීමාවෙන් දුරස්ථව පිහිටා ඇති බැවින්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු වැව් හා ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් සිදුවී ඇති පරිසර හානිය අවම කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් පරිසරයට දැඩි හානියක් සිදුවී ඇති බැවින්, එම පරිසර හානිය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා, — මහනුවර රෝහල් පරිශ්‍රයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම,— යහපාලන රජය යටතේ මහනුවර රෝහල දෙවැනි ජාතික රෝහල ලෙස දියුණු කිරීමට පියවර ගනිමින් සිටින බැවින්, එම රෝහල් පරිශ්‍රයේ ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අයහපත් කාලගුණය නිසා ඇතිවන වසංගත තත්ත්වයන් ව්‍යාප්තවීම වැළැක්වීම,— අයහපත් කාලගුණය නිසා ඇතිවන ජල ගැලීම් වලින් පසුව ආපදාවට ලක්වූ ප්‍රදේශවල ජලය බැස යාමත් සමඟ මී උණ, පාචනය ඇතුළු බෝවන රෝග පැතිරයාමේ අවදානමක් පවතින බවට අදාළ ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් පෙන්වා දී ඇති බැවින්, එවැනි වසංගත තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම,— කෘෂිකාර්මික රටක් වන අප රටෙහි ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂි කර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගාවල ජලයෙන් විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේදී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාවට දක්ෂතා දක්වන විශාල පිරිසක් සිටින බැවින් එම පිරිස ජාත්‍යන්තර තලයට ගෙන යාමට හැකිවන අයුරින් මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— වර්තමානයේ ලෝකයේ ජලජ පැළෑටි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, එමඟින් අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේ පුළුල් අවස්ථාවක් උදා වී ඇති අතර, මෑතකදී ජපන් විශේෂඥයන් විසින් සිය පර්යේෂණ වාර්තාවක ජලජ පැළෑටි වගාව සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශය ඉතා යෝග්‍ය බව පෙන්වා දී ඇති පසුබිමක ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාත තුළ මේ වනවිට පිළිකා රෝගීන් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගී ජනතාව වෙනුවෙන් වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ළමා රෝහල වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ පවතින ඇඩි තදබදය අවම කිරීම සඳහා මෙන්ම, වයඹ හා උතුරු මැද පළාතේ ජනතාවට ප්‍රයෝජනවත් වන පරිදි වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කිරීම,— යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට අපේක්ෂා කරන බැවින්, එම කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — කල්පිටිය ආශ්‍රිතව තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— වයඹ පළාතේ කල්පිටිය ප්‍රදේශයේ තල් ආශ්‍රිත කර්මාන්ත පසුගිය වසර කිහිපය තුළ දරුණු කඩා වැටීමකට ලක් වී ඇති බැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුව, ඉදිරියේදී කල්පිටිය ප්‍රදේශය සංචාරක පුරවරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව එම ප්‍රදේශයේ තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ද දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුනේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ වකුගඩු රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෑත කාලීනව විශාල ලෙස වකුගඩු රෝගය පැතිරීම ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගීන් වෙනුවෙන් වයඹ පළාත තුළ රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැලසීමියා රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— මෑතකාලීනව ශ්‍රී ලංකාවේ වැඩිම තැලසීමියා රෝගීන් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර, තවමත් එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෙනම රෝහලක් ස්ථාපිත කර නොමැති බැවින්, එම රෝගීන් සඳහා වෙනම රෝහලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ වැඩිම විහාරස්ථාන සංඛ්‍යාවක් පිහිටා ඇති, ස්වාමීන්වහන්සේලා වැඩිම ප්‍රමාණයක් වැඩ සිටින, බෞද්ධයන් වැඩිම පිරිසක් වාසය කරන හා ශාසනාරක්ෂක බල මණ්ඩල වැඩිම සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පවතින වයඹ පළාතෙහි ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 37/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'19

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වලදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'19

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කිරීම,— කොළඹ නගරය සහ එහි තදාසන්න නගර පරිපාලනය සඳහා කොළඹ, කඩුවෙල සහ කෝට්ටේ යනුවෙන් මහ නගර සභා තුනක් පැවතිය ද, මෙම මහ නගර සභා බල ප්‍රදේශ තුනටම මායිම්ව ඇති කොළොන්නාව මැතිවරණ කොට්ඨාසය පාලනය වන්නේ ප්‍රාදේශීය පරිපාලන ඒකක දෙකක් වන කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව යටතේ වන බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම ආර්ථික, සමාජයීය හා සංස්කෘතික විෂමතාවන් ඇති කිරීමට මෙය හේතු වී ඇති අතර, අවට පවතින මහ නගර සභා, පරිපාලනයේ කාර්යක්ෂමතාව මත ශීඝ්‍ර සංවර්ධනයක් මේ වනවිට ළඟා කර ගෙන ඇති බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම සංවර්ධනය අරමුණු කර ගනිමින් කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ කර කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බුලත් වගාව නඟා සිටුවීම,— ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල විශාල පිරිසකගේ ජීවනෝපාය වන බුලත් වගාව, රටට විදේශ විනිමය ගෙන එන කෘෂිකාර්මික බෝගයක් වන අතර, ශ්‍රී ලංකාවෙන් බුලත් මිලදී ගන්නා ප්‍රධාන රටක් වන පාකිස්ථානය මෑතකදී එරටට ආනයනය කරන බුලත් සඳහා පනවන ලද බදු මෙන්ම, වගාවට දේශීයව බලපාන්නා වූ කරුණු ගණනාවක් හේතු කොට ගෙන දේශීය බුලත් මිල ඉතාමත් පහළ මට්ටමකට වැටී ඇති පසුබිමක බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු ද අක්‍රමවත් වී ඇති බැවින්, මෙම තත්ත්වයන් හමුවේ අසීරුතාවයට පත්වී සිටින බුලත් ගොවීන් නඟා සිටුවීමටත්, අවශ්‍ය අපනයන දිශාවන් සොයා ගැනීමටත් අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම වඩා කාර්යක්ෂම කිරීම මඟින් බුලත් වගාව නඟා සිටුවීම සඳහා පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වාණිජ බැංකු මඟින් රටේ පුරවැසියන්ට විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා ණය ලබා දීමේදී දේපළ ඇප මෙන්ම, පුද්ගල ඇප ද තබා ගන්නා අතර මෙහිදී ඇපකරු ණයගැතියා වෙත සිදුකරන්නේ උපකාරයක් වුවත්, යම් හෙයකින් ණයගැතියා ණය ගෙවීම පැහැර හැරියහොත්, ණයගැතියා ඇතුළුව ඇපකරුවන්ගේ නම් ද ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනයට ඇතුළත් කිරීමෙන් ඇපකරුට බලවත් අසාධාරණයක් සිදුවන අතර ගනුදෙනුව සම්ප්‍රදායකට පත්වන තුරු ඇපකරුට බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් හමුවේ රටේ නව ව්‍යවසායකයන් බිහිවීමට මෙන්ම, දළ ජාතික නිෂ්පාදිතයට ද අහිතකර ලෙස බලපෑම් සිදුවිය හැකි බැවින් ඇපකරුවන් සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වා ගෙන යෑමේ අරමුණින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම,— ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන විශාල වශයෙන් පිහිටුවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ක්‍රමවත් අධ්‍යාපනය රටක සංවර්ධනයට උපකාරී වන බැවින්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල බිහිවීම පැති කිහිපයකින්ම රටට හිතකර වන නමුත් මෙම ආයතනවලින් ලබාදෙන සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා වන පරිදි පිළිගත් ප්‍රමිතියකින් යුතුව ලබාදීම ඉතා වැදගත් බැවින් පළපුරුදු විද්වතුන්ගේ හා අධ්‍යාපනඥයන්ගේ මැදිහත් වීම තුළින් අදාළ පාඨමාලාවල අන්තර්ගතය විමසුමකට ලක්කරමින් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් සිදුවන සේවාව උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා දැනට පවතින නීති පද්ධතිය ශක්තිමත් නොවන හෙයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික මූල්‍ය ආයතන පවත්වාගෙන යාමට අදාළ පනත් සංශෝධනය කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම,— පෞද්ගලික මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේදී තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවන අවස්ථා ඇති බැවින්, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි මූල්‍ය සමාගම්වල ව්‍යාපාරික කටයුතු සිදුකර ගෙන යාමට ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන ශක්තිමත් නොවන හෙයින්, 2007 අංක 7 දරන සමාගම් නීතිය සංශෝධනය කොට බුන්වත් නීතිය ශක්තිමත් කිරීම කඩිනමින් සිදුකර ඊට සහාය සඳහා 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත, 2011 අංක 1 සහ 19 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් සංශෝධනය කිරීම තුළින් රට තුළ ශක්තිමත් මූල්‍ය අංශයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිසි ප්‍රමිතියෙන් යුතුව සුළු අපනයන බෝග නිෂ්පාදනය කිරීම,— සුළු අපනයන බෝග නිෂ්පාදනය නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකිරීම මඟින් වගාකරුවන්ට මෙන්ම, රටට ද අහිතකර ලෙස බලපෑම් ඇතිවන අතර, රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා අපනයන වැඩිකර ගැනීම උපකාරී වන නමුත්, ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝගවලට ජාත්‍යන්තරයේ තිබූ ඉහළ කීර්ති නාමය ගොරකාවලට යූරියා මිශ්‍ර කිරීම වැනි කූට ක්‍රම හේතුවෙන් පළුදු වී ඇති අතර මෙරට නිෂ්පාදිත සුළු අපනයන බෝග සඳහා ඇති විදේශීය ඉල්ලුම අඩුවීමෙන් දේශීය මිල ද පහත වැටී ඇති පසුබිමක මෙම තත්ත්වය වහා වෙනස් කර නිෂ්පාදනය කරන සුළු අපනයන බෝගවල ප්‍රමිතිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය හඳුන්වාදීම සහ ස්ථාපිත කිරීම,— දිවයිනේ ඇති වාණිජ බැංකු මඟින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් දිරිගැන්වීමෙහිලා ලබා දෙන මූල්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවන බැවින් ලෝකයේ දියුණු රටවල භාවිතා වන ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම මඟින් නව ව්‍යවසායකයන් බිහිවීමේ ප්‍රවණතාවය ඉහළ යා හැකි අතර නව අදහස් සමඟ බැංකුවට පැමිණෙන තරුණ ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාව තේරුම් ගෙන ඔවුනට මූල්‍ය පහසුකම් පමණක් නොව ව්‍යාපාරික දැනුම හා නිරන්තර රැකවරණය ලබා දීම මෙම බැංකු ක්‍රමයේ ඇති විශේෂතා වන අතර, එමඟින් රැකියා උත්පාදනය සමඟ ජාතික නිෂ්පාදිතය වැඩිවීමෙන් රටේ සංවර්ධනයට ද උපකාරි වන බැවින් ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන අධීක්ෂණයට භාජනය කිරීම,— දිවයිනේ බොහෝ ස්ථානවල ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන වැඩි වැඩියෙන් බිහිවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ව්‍යවසායකයන් බිහිවීම රටට හිතකර වුවත්, එයින් සමාජයට යහපතක් සිදුවිය යුතු බැවින්, බොහෝ ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානවල සිදුවන විෂමාචාර ක්‍රියා වැළැක්වීම සඳහා මෙන්ම, එමඟින් සමාජයීය වශයෙන් ප්‍රතිලාභ සහිත හිතකර තත්ත්වයක් ඇති කිරීම සඳහා මෙම ආයතන ලියාපදිංචි කිරීමට බලය ඇති ආයතන සහ පලාත් පාලන ආයතන මඟින් ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන නිරන්තර අධීක්ෂණයට භාජනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා, — "ඉන්දියානු දෙමළ" ශීර්ෂය යටතේ සංගණනයට භාජනය වූ ජන කොටස ඉදිරි සංගණන වලදී "කඳුරට දෙමළ" ශීර්ෂය යටතේ සංගණනය කිරීම,— ඉන්දියාවෙන් මෙරටට රැගෙන එන ලද ඉන්දියානුවන් "ඉන්දියානු දෙමළ" ශීර්ෂය යටතේ සංගණනයට භාජනය කෙරෙන අතර වර්තමානයේදී ඔවුන් "කඳුරට දෙමළ" ලෙස තමන්ව හඳුන්වා ගනිමින් ශ්‍රී ලාංකික පුරවැසිභාවය පූර්ණ වශයෙන් භුක්ති විඳින නමුත් "ඉන්දියානු දෙමළ" ලෙස හැඳින්වීමෙන් ඔවුන්ගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රශ්න කෙරෙන ස්වභාවයක් ඇති බැවින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියට සිදුකෙරෙන සංගණනවලදී මෙම ජන කොටස "කඳුරට දෙමළ" ශීර්ෂය යටතේ සංගණන කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කිරීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය තුරන් කිරීමට කඩිනම් පියවර ගැනීම,— ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ආක්‍රමණශීලී ශාක විශේෂයන් ගණනාවක් ව්‍යාප්ත වෙමින් පවතින අතර යම් යම් සංවිධාන සහ පුද්ගලයන් විසින් දිවයිනේ මංමාවත් දෙපස, සුසාන භූමිවල සහ ක්‍රීඩා පිට්ටනි ආදී පොදු ස්ථානවල රෝපණය කරන ලද ඇකේෂියා වැනි ශාක හේතුකොටගෙන මී මැසි ප්‍රජාවගේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් වී ඇති බව එම ප්‍රදේශවල සිදුකරන ලද පර්යේෂණවලින් සනාථ වී ඇති බැවින්, ශාක මෙන්ම, සත්ත්ව ප්‍රජාවගේද පැවැත්මට ප්‍රබල තර්ජනයක් වී ඇති මෙවැනි ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය වළක්වා මුළුමනින්ම තුරන් කිරීමට කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට දීර්ඝ ඉතිහාසයක් පවතින අතර පසුගිය වසර 25ක කාලය තුළ ඔයිල් ෆාම් ප්‍රමුඛ නව බෝග වගාවන් වැවිලි ක්ෂේත්‍රයට ඇතුළත් වී ඇති අතර පුද්ගලීකරණයට ලක්වී ඇති වැවිලි ක්ෂේත්‍රයේ නොමනා කළමනාකරණය හේතුවෙන් මෙම ක්ෂේත්‍රය පරිහානියට පත්වී කම්කරුවන්හට පවා විශ්වාසයෙන් යුතුව තම රැකියාවන්හි නිරත වීම සඳහා වන ආර්ථික සමාජ පරිසරයක් එහි දක්නට නොමැති බැවින්, අප රටේ ප්‍රධාන අපනයන ආදායම් ක්ෂේත්‍රයක් වන වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය දැනට සිදුකර ඇති පෞද්ගලීකරණයෙන් ඉවත් කොට රජයේ මැදිහත්වීම යටතේ නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දී ඒවා තිරසාරව පවත්වාගෙන යාමට රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සිනමා ඇකඩමියක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලාංකීය සිනමා කර්මාන්තය මේ වනවිට 70 වැනි වසර පසු කරමින් සිටින අතර ජාත්‍යන්තර සිනමා උළෙල ජය ගැනීමට තරම් දක්ෂ චිත්‍රපට අධ්‍යක්ෂකවරුන්, නළු නිළියන් ඇතුළු නිර්මාණ ශිල්පීන් බිහි කිරීමට ශ්‍රී ලංකාව සමත්ව තිබුණ ද, එය විෂයයක් ලෙස අනාගත පරපුර වෙත විධිමත්ව ගෙන යාම සඳහා අප රටට තවමත් සිනමා ඇකඩමියක් නොමැති බැවින්, වෘත්තීය සිනමාවක් බිහිකර ගැනීමේ අරමුණ සහිතව සිනමා ඇකඩමියක් කඩිනමින් ස්ථාපනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නූතන කලාගාරයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ Modern Art හෙවත් නූතන කලාවේ නිරත ශිල්පීන් අප රටේ සිටිය ද, ඔවුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා නූතන කලාගාරයක අඩුවක් පවතින අතර, එවැනි කලාගාරයක් මඟින් අපගේ චිත්‍ර හා මූර්ති ශිල්පය ඇතුළු කලා කටයුතු පෝෂණය මෙන්ම, සංචාරක ව්‍යාපාරයේ වැඩි දියුණුව ද සිදුවන බැවින්, එවැනි නූතන කලාගාරයක් (Modern Art Gallery) කොළඹ ආශ්‍රිතව ස්ථාපනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීම,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හෙවත් ඊ - අපද්‍රව්‍ය අප රටට බරපතළ අනතුරක් නිර්මාණය කරමින් තිබෙන අතර දැනට වාර්ෂිකව මෙට්‍රික් ටොන් 92,000ක පමණ ඊ - අපද්‍රව්‍ය ජනනය වන අතර, වර්ෂ 2020 වනවිට එය මෙට්‍රික් ටොන් 120,000 දක්වා වැඩිවෙතැයි අපේක්ෂා කෙරෙන අතර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, ඒවා බැහැර කිරීම සහ එහි ඇති පාරිසරික හා සෞඛ්‍යමය අනතුර පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත්, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් හා අඛණ්ඩ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/'19

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— මතභේදයට තුඩු දී ඇති "බැටිකලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රජයට පවරාගෙන "මඩකලපුව විශ්වවිද්‍යාලය" ලෙස නම් කිරීම,— රටේ මහත් ආන්දෝලනයකට තුඩු දී ඇති හිරා පදනම මඟින් ආරම්භ කර ඇති "බැටිකලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය සහ එම ආයතනය මඟින් ඉදිකිරීමට යෝජිත දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමට අනුමතිය ලබා ගැනීමේ අරමුණින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනය සමාජයේ දැඩි විවේචනයට ලක්වෙමින් පවතින අතර මෙයට ඉඩම් ලබා දී ඇති සහ මුදල් ආධාර ලැබී ඇති ක්‍රමවේදය ඇතුළු යම් යම් ක්‍රමවේදයන් සම්බන්ධයෙන් පැන නැඟී ඇති කරුණු සැලකිල්ලට ගෙන ශරියා විශ්වවිද්‍යාලයක් ලෙස පටබැඳි නාමයකින්ද හඳුන්වන "බැටිකලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය සහ ඊට සම්බන්ධ සියලු ගොඩනැගිලි රජයට පවරාගෙන රාජ්‍ය විශ්වවිද්‍යාලයක් බවට පත්කර එය "මඩකලපුව විශ්වවිද්‍යාලය" ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ත්‍රස්තවාදීන්ට හා ත්‍රස්තවාදී සංවිධානවලට සම්බන්ධ වූ අයට මරණ දඬුවම ලබාදීම සහ ඔවුන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීම,— ජාත්‍යන්තර හෝ දේශීයව ත්‍රස්තවාදයට සම්බන්ධ ත්‍රස්තවාදීන්ට මෙන්ම, එම ත්‍රස්තවාදී සංවිධානවලට සහ ක්‍රියාකාරීන්ට සෘජුව හෝ වක්‍රව ආධාර, උපකාර, අනුබලදීම් කරන පුද්ගලයන්ගේ එකී ක්‍රියාකාරකම් පිළිබඳව අධිකරණයෙන් ඔප්පු වූ අවස්ථාවකදී, ඔවුන් සතු සියලු දේපළ රාජසන්තක කොට මරණ දඬුවම ලබාදිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— සියලුම මද්රසා පාසල් සහ අරාබි පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා ගැනීම,— දැනට මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දිවයිනේ පිහිටි සියලුම මද්රසා පාසල් සහ අරාබි පාසල් වහාම අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරාගෙන මෙම පාසල් තුළ විෂයයක් ලෙස සිංහල ඉතිහාසය ඉගැන්වීමටත්, එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ආගම් සහ ජාතීන් අනුව වර්ග නොවන මිශ්‍ර පාසල් බවට පත්කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ඉදිරි වසරේ සිට ක්‍රමානුකූලව මිශ්‍ර පාසල් බවට පත්කිරීමටත්, සිංහල, දෙමළ, මුස්ලිම්, කතෝලික යනුවෙන් පාසල් ස්ථාපිත කිරීමට අනාගතයේදී ඉඩ නොදීමටත්, ජාතීන් අනුව යම් ප්‍රතිශතයක් යටතේ පාසල් වෙත ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතීන් හෝ ආගම් අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වර්තමානයේ උද්ගතව ඇති තත්ත්වය සැළකිල්ලට ගෙන ශ්‍රී ලංකාව තුළ ජාතීන් හෝ ආගම් අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කොට දැනට එසේ ජාතීන් හෝ ආගම් නමින් ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂවල නාමයන්ද වෙනස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71 /'19

ගරු තිලංග සුමතිපාල මහතා,— "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රජයට පවරාගෙන රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම,— පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පැන නැගී ඇති බැරෑරුම් තත්ත්වය හමුවේ විශේෂයෙන්ම බහුතර ප්‍රජාවගේ ආරක්ෂාව පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාවට ඉදිරියේදී එවැනි අවස්ථාවන් ඇති නොවීමටත්, විශේෂයෙන්ම අන්තවාදී මත දරන්නන්ගෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ මෙන්ම, සමස්ත ශ්‍රී ලංකාවම ආරක්ෂා කර ගැනීමටත්, "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට පවරාගෙන රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් බවට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— පඬුවස්නුවර රාජධානිය සංචාරක සැලැස්මට ඇතුළත් කොට සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ පැරණි රාජධානියක් ලෙස සැලකෙන පඬුවස්නුවර රාජධානිය සංචාරක සැලැස්මට ඇතුළත් කොට සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පුරවැසියන්ගේ සෞඛ්‍ය අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීම,— ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම තමන්ට වැළඳෙන රෝගාබාධයක් හෝ මුහුණපෑමට සිදුවන අනතුරක් හෝ සම්බන්ධයෙන් රජයේ වියදමින් නොමිලේ ප්‍රතිකාර ලබා ගැනීමට ඇති අයිතිය ද, බෝවන හෝ බෝනොවන රෝගාබාධ වළක්වා ගැනීමට අවශ්‍ය නිවාරණ හා උපදේශන මෙන්ම, පුනරුත්ථාපන සේවාවන් ගුණාත්මකව හා සාධාරණව ලබා ගැනීමට ඇති අයිතිය ද පිළිගනිමින් එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'19

ගරු රොෂාන් රණසිංහ මහතා,— ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ විවාහ සම්බන්ධයෙන් පොදු නීති මාලාවක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ජාතීන් බෙදා වෙන් කරන ආකාරයේ නීති රට තුළ ක්‍රියාත්මක වන හෙයින්, ඒවා නිවැරදි කිරීම පිණිස විශේෂයෙන් විවාහවීමේ නීතිය සෑම පුරවැසියෙකුටම පොදු නීතියක් විය යුතු බවත්, උඩරට විවාහ නීතිය, මුස්ලිම් විවාහ නීතිය වශයෙන් වෙනස් නොවිය යුතු බවත්, එක් පුරවැසියෙකුට සිදුකර ගත හැක්කේ එක් විවාහයක් පමණක් බවත්, එය වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් අනතුරුව බවත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ විවාහ සම්බන්ධයෙන් පොදු නීති මාලාවක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.